www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## බ්‍රසල්ස්හි ෆෝක්ස්වාගන් කම්කරුවන් වෙත

# කම්හල විකුනා දැමීමට වෘත්තීය සමිති හා කාර්ය සභා දරන තැතට එරෙහිව ඡන්දය දෙනු !

## To Volkswagen workers in Brussels
## Vote against the sell-out organised by the unions and works councils!

**ලෝසවෙඅ කර්තෘ මන්ඩලයේ ප්‍රකාශය**
**2007 ජනවාරි 6**

බෙල්ජියමේ බ්‍රසල්ස්හි පිහිටි ෆෝක්ස්වාගන් ෆොරස්ට් කර්මාන්ත ශාලාවේ දී කම්හල් කාර්ය සභාව හා සමාගම් කලමනාකාරිත්වය අතර සාකච්ඡාවෙන් ඇති කර ගත් ගිවිසුම පිලිබඳව ඡන්දය ප්‍රකාශ කිරීම ජනවාරි 5 වන සිකුරාදා ඇරඹුනි.

ජනවාරි 4 වන දා පැවති සිය රැස්වීමේ දී, ෆොරස්ට් කාර්ය සභා හා වෘත්තීය සමිති නායකත්වය ෆෝක්ස්වාගන් කම්කරුවන්ගේ අවශ්‍යතාවන්ට සෘජුව ම එරෙහි වූ ගිවිසුමක් ඇති කර ගනිමින් සාකච්ඡා හමාර කලේ ය. 5,400ක් වන වත්මන් ශ්‍රම බලකාය 2,200 දක්වා කපා හැරිය යුතු යැයි ගිවිසුමෙන් කියා සිටී.

කලමනාකාරිත්වයේ ආරම්භක සැලැස්මට අනුව, ෆෝක්ස්වාගන් ගොල්ෆ් මොඩලයේ වාහන නිෂ්පාදනය ක්‍රමයෙන් අඩුකොට අවසන් වීමට නියමිතව තිබෙන්නේ බ්‍රසල්ස් කම්හලෙහි ය. මීලඟ දෙවසර තුල වාහන 200,000ක් නිපදවීමට සැලසුම් කොට තිබුන ද එය ඒකක 82,500 දක්වා (එනම්, ගොල්ෆ් මොඩලයේ වාහන 12,500ක්, පෝලෝ මොඩලයේ වාහන 46,000ක් හා තව මත් නිශ්චය කොට නැති මොඩලයකින් වාහන 24,000ක්) අඩු කෙරෙනු ඇත.

ගිවිසුමෙන් සහතික කොට ඇති පරිදි, බ්‍රසල්ස්හි ෆොරස්ට් ෆෝක්ස්වාගන් කම්හලේ නිෂ්පාදන කටයුතු පවතිනු ඇත්තේ තවත් වසර දෙකක්, එනම් 2008 වසරේ අවසානය දක්වා, පමනි. කලමනාකාරිත්වය නියම කොට ඇති පරිදි, ඉන් ඉදිරියට නිෂ්පාදනය පවත්වා ගෙන යාමට යම් තීන්දුවක් ගත හොත්, එය වැඩ කරන අතිරේක පැය ගනන් සඳහා කිසිදු ගෙවීමකින් තොර දිගු වැඩ සතියක් හඳුන්වා දීම සමග බැඳෙනු ඇත.

කලමනාකාරිත්වය අනුගමනය කරන මූලෝපායට අනුව, මෙම දෙවසරක කාල සීමාවෙන් පසුව ෆොරස්ට්හි කම්හල වසා දැමේ (බොහෝ කම්කරුවන්ගේ සැකයට ලක්ව පවතින්නේ මෙම කරුන යි), නැත් නම්, නිදසුනක් ලෙස ස්පාඤ්ඤයේ පම්ප්ලෝනාහි පවතින සිය කම්හල වසා දමා එහි නිෂ්පාදනය බ්‍රසල්ස් කරා මාරු කෙරෙනු ඇත. ප්‍රතිඵලය කුමක් වුව ද, බ්‍රසල්ස්හි ශ්‍රම බලකායට එරෙහිව දැන් එල්ල කෙරෙමින් පවතින ප්‍රහාරය යනු ෆොක්ස්වාගන් කලමනාකාරිත්වය විසින් යුරෝපයේ පවත්නා සිය කර්මාන්ත ශාලා පුරා කර ගෙන යාමට නියමිත වඩා පුලුල් පරිමාන ප්‍රහාර හා දොට්ට දැමීම්වල ආරම්භයක් පමනකි.

ස්වේච්ඡාවෙන් රැකියාව අත හැර යන කම්කරුවන් වෙනුවෙන් ලබා දෙන සාපේක්ෂව ඉහල මට්ටමේ වූ වන්දිය "දැවැන්ත ජයග්‍රහනයක්" යැයි කියමින්, කම්කරුවන්ගේ විරෝධය මැඩ ඔවුන් එකඟතාවට නම්මා ගැනීමට කාර්ය සභාවේ හා වෘත්තීය සමිතිවල නිලධාරීහු ප්‍රයත්න දරති. තාවකාලිකව ඇති කර ගත් ගිවිසුමට අනුව, දොට්ට දැමෙන කම්කරුවෙකු සඳහා ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව යුරෝ 25,000ත් (එක්සත් ජනපද ඩොලර් 32,500ත්) 144,000ත් (එක්සත් ජනපද ඩොලර් 187,000ත්) අතර මුදලක් ලැබෙන බව ප්‍රකාශ වේ. එහෙත්, "ත්‍යාගශීලී" යැයි කියනු ලබන මෙම වන්දිය ලබා දීමට සැලසුම් කොට ඇත්තේ, කලින් විශ්‍රාම ගන්නා, වයස අවුරුදු 50ට වැඩි, ආසන්න වශයෙන් 900ක් පමන වූ කම්කරුවන් සංඛ්‍යාවකට ය.

කම්හලේ කම්කරුවන් පැහැදිලි කරන්නේ, රැකියා 3,200ක් විනාශ කිරීමට දෙන ඡන්දය, වන්දි මුදල් ලබාදීමේ හා කලින් විශ්‍රාම ගැන්වීමේ වැඩ පිලිවෙල සම්බන්ධයෙන් ඇති කර ගත් ගිවිසුමට සෘජුවම ගැට ගැසීමට නියමිත බව යි. වෙනත් වචනවලින් කිව හොත්, රැකියා අහිමි වීමට එරෙහිව කවුරුන් හෝ ඡන්දය දෙන විට එය වන්දි හා විශ්‍රාම පැකේජයට එරෙහිව ඡන්දය දීමක් ද වන බව යි. මේ අයුරින් සමිති විසින් පැරනි හා තරුන කම්කරුවන් මෙන් ම නිෂ්පාදන කම්කරුවන් හා කාර්යාලයීය කම්කරුවන් ද එකිනෙකාට එරෙහිව කොටවනු ලැබේ.

ගිවිසුම එකහෙලා ප්‍රතික්ෂේප කරන ලෙසත් සංගතවල මෙම නින්දිත උපාමාරුව ප්‍රතික්ෂේප කරමින් ඊට එරෙහිව ඡන්දය දෙන ලෙසත් බ්‍රසල්ස්හි ෆෝක්ස්වාගන් කම්කරුවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩලය ඉල්ලා සිටී.

අතිරික්තය ඉවත් කිරීමේ හා වන්දි ලබා දීමේ ස්වරූපයෙන් රැකියා විකුනා දැමීම මගින් සමස්ත කම්කරු පන්තියේ රැකියාවලට වල කැපෙනවා පමනක් නො වේ. එය මෙම රැකියා සඳහට ම අහිමි වන තරුන කම්කරු පරම්පරාවේ අනාගතය ද ප්‍රශ්නයට බඳුන් කරයි. සමස්ත ජනතාවට ම විනාශකාරී ප්‍රතිඵල ඇති කරමින් (දකුනු බෙල්ජියමේ) වැලෝනියාහි හා ජර්මනියේ රූර් දිස්ත්‍රික්කයේ වානේ හා ගල් අඟුරු කර්මාන්ත සහිත ප්‍රදේශ ද ඇතුලු සමස්ත කාර්මික ප්‍රදේශ ම මේ අයුරින් ම මුඩුබිම් බවට පත් කොට තිබේ.

බොහෝ කම්කරුවන් මේ වන විටත් වන්දි පැකේජයට එකඟ වී තිබේ ය යන කරුන, හෝ ගිවිසුමට පක්ෂව ඡන්දය දිය යුතු යැයි සිතමින් සිටින්නේ ය යන කරුන, කම්කරුවන් රැකියා විනාශ කිරීමට සිය එකඟතාව පල කිරීමක් නො වේ. ඉන් පිලිබිඹු වන්නේ වෘත්තීය සමිති පිලිබඳව ඔවුන්ට කිසිදු විශ්වාසයක් නැතිකම යි. වෘත්තීය සමිති හා කාර්ය සභා එක්ව සංවිධානය කල විකුනා දැමීම බොහෝ කම්කරුවන් විසින් සලකනු ලබන්නේ අත්සන් කොට මුද්‍රා තැබූවක් ලෙසට වන අතර, රැකියා ආරක්ෂා කිරීම සඳහා මෙම සංවිධාන කිසිදු දිගු කාලීන හෝ මූලධර්මාත්මක සටනක් කරනු ඇතැයි කිසිදු කම්කරුවෙක් අපේක්ෂා නො කරයි.

සාකච්ඡාවෙන් ඇති කර ගත් එකඟතාව ප්‍රතික්ෂේප කිරීම යන දෙය, ෆෝක්ස්වාගන් කම්කරුවන් ක්‍රමානුකූලව වංචාවට ලක් කරමින් පාලක මන්ඩලය හා සමිති නිලධරයන් එල්ල කරන ප්‍රහාරයට එරෙහි අරගලයක ද මූලධර්මාත්මකව සියලු කම්කරු රැකියා ආරක්ෂා කිරීමක ද ආරම්භක ලක්ෂ්‍යය බවට පත් කර ගත යුතු ය.

මේ සඳහා "සමාජමය හවුල්කාරිත්වය" හා "සාමූහික අධිෂ්ඨානය" පිලිබඳ සංකල්පවලින් දේශපාලනිකව බිඳී වෙන් වී ගැනීමක් අවශ්‍ය වේ. ඒ වෙනුවට, නූතන නිෂ්පාදනයේ ජාත්‍යන්තර ස්වභාවයට හා ලෝකය පුරා කම්කරුවන්ගේ පොදු අවශ්‍යතාවල අනුකූල වූ මුලුමනින් ම නව්‍ය ඉදිරිදර්ශනයක් අවශ්‍ය වේ. මහ ව්‍යාපාරිකයන්ගේ හා බැංකුවල ප්‍රමුඛතාවන්ට හා ලාභවලට ඉහලින් සාමාජීය අවශ්‍යතාවන් පිහිටුවන එවන් ඉදිරිදර්ශනයක්, සමාජය සමාජවාදී පරිවර්තනයකට ලක් කිරීම ඉල්ලා සිටී.

ධනවාදී පද්ධතිය ආරක්ෂා කිරීමේ සිය පිලිවෙතින් නිර්නය වන වෘත්තීය සමිතිවල නිවට හා බංකොලොත් දේශපාලනයට විරෝධය පල කරනු වස්, කම්කරුවන් දැවැන්ත පරිමානයෙන් රැකියාවලින් ඉවත් කිරීමට හා සමාජ සුභසාධන සේවාවන් කප්පාදුවට එරෙහිව ස්වාධීන කම්කරු කමිටු ගොඩ නැඟීමට අප කල කැඳවුම යලිත් කරමු. රැකියා ආරක්ෂා කිරීමේ අරගලය එවන් සමාජවාදී, ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් හා ඒකාබද්ධ කිරීම තුල අපි අපගේ සහාය පුද කරන්නෙමු.

© www.wsws.org